ආරක්ෂක අමාත්‍යාංශය
பாதுகாப்பு அமைச்சு
MINISTRY OF DEFENCE
ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, ශ්‍රී ලංකාව.
பாதுகாப்பு தலைமையக கட்டிடம், ஸ்ரீ ஜயவர்தனபுர, கோட்டே, இலங்கை.
Defence Headquarters Complex, Sri Jayawardenepura, Kotte, Sri Lanka. Website : www.defence.lk

තැ.පෙ. / த.பெ. / P.O. Box 572
දුරකථන / தொலைபேசி / Telephone 2430860-9, 2430870-8
ලේකම් / செயலாளர் / Secretary — දුර./தொ./Tel. : 011 2381154; ෆැක්ස්./பெ./Fax.: 011 2541529; වි. තැපැල./மி.அ./Email : secdefence@defence.lk

මගේ අංකය / எனது இல / My No: MOD/DEF/GS/SALW/8/SLA/1

ඔබේ අංකය / உமது இல / Your No

දිනය / திகதி / Date: 2021.07.01

යුධමය සංචාරක ... පැවති වකවානුවේ ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරියේ යෙදී සිටියදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් ආබාධිත ව සේවයෙන් ඉවත්වන ත්‍රිවිධ හමුදා සහ පොලිස් සාමාජිකයින් එම ආබාධිත බව හේතුවෙන්ම වයස අවුරුදු 55 එළඹීමට පෙර ජීවිතක්ෂයට පත් වුවහොත් එම මියගිය සාමාජිකයාගේ යැපෙන්නන්ට සාමාජිකයාගේ වයස අවුරුදු 55 වන තෙක් වැටුප් හා දීමනා හිමිගැන්වීම

උක්ත මැයෙන් ගරු ආරක්ෂක අමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද MOD/CP/DEF/60/2020 හා 2020.09.10 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා අංක අමප/21/0561/303/047 හා 2021.04.27 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අනුමැතිය ලබා දී ඇත.

2. ක්‍රියාන්විත ප්‍රදේශවලදී සෘජුවම ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් තුවාල ලබා ආබාධිතව අංක අමප/1982/305 (09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව මෙම අමාත්‍යාංශයේ අනුමැතිය සහිතව වෛද්‍ය හේතූන් මත සේවයෙන් විශ්‍රාම ගනවා ඇති හමුදා පුද්ගලයකු ඔහුගේ/ ඇයගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වීමට පෙර පහත සඳහන් හේතුවකින් මියගිය හොත්, මියගිය සාමාජිකයා ජීවත්ව සිටියේ නම් ඔහු ගේ වයස අවුරුදු 55 සම්පූර්ණ වන දිනය දක්වා හිමිගැන්වෙන වැටුප් හා දීමනා ... මියගිය අයගේ යැපෙන්නන් වෙත ගෙවීම සිදුකළ යුතුය.

අ. එම ආබාධිත බව හේතුවෙන්ම මියයාම

ආ. එම ආබාධිත බව හේතුවෙන් ඇති වූ මානසික ව්‍යාකූලතාවයක් නිසා සිදු වූ සියදිවි හානිකර ගැනීම

2.1 ඉහත සඳහන් පරිදි සහන සඳහා සුදුසුකම් ලැබීමට හමුදා සාමාජිකයා ආබාධිත තත්ත්වයට පත්වීමට අදාළ සිදුවීම, අංක අමප/1982/305 (09) හා 1982.07.21 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයේ විධිවිධාන යටතේ ආවරණය වන සිදුවීමක් විය යුතු අතර එය 1977.07.22 දින සිට 2009.05.19 දින දක්වා (දෙදිනම ඇතුළත්ව) අදාළ කාලසීමාව තුළ සිදුවී තිබිය යුතුය.



අතිරේක ලේකම් (පරිපාලන) / மேலதிக செயலாளர் (நிர்வாகம்) / Additional Secretary (Administration) — දුර./தொ./Tel. - 011 2326000; ෆැක්ස්./பெ./Fax. - 011 2446300
අතිරේක ලේකම් (සිවිල් ආරක්ෂක හා සංවර්ධන) / மேலதிக செயலாளர் (சிவில் பாதுகாப்பும் அபிவிருத்தியும்) / Additional Secretary (Civil Defence and Development) — දුර./தொ./Tel. - 011 2335792; ෆැක්ස්./பெ./Fax. - 011 2335797
අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) / பணிப்பாளர் நாயகம் (திட்டமிடல்) / Director General (Planning) — දුර./தொ./Tel. -011 2333963; ෆැක්ස්./பெ./Fax -011 2336559

3. ඉහත 2 හි සඳහන් යැපෙන්නන් යන්නට පහත සඳහන් අයවළුන් පමණක් ඇතුලත් වේ.

අ. මියගිය හමුදා සාමාජිකයාගේ කලත්‍රයා

ආ. කලත්‍රයා මියගිය අවස්ථාවක දී හෝ නිත්‍යානුකූලව හෝ වාසය හා සංවාසය මගින් නැවත විවාහයකට එළඹී ඇති/ එළඹෙන විට හමුදා සාමාජිකයාට දාව උපන් වයස අවුරුදු 26ට අඩු අවිවාහක රැකියා විරහිත අධ්‍යාපනයේ නිරත වන දරුවන්

ඇ. අවිවාහකව මියයන හමුදා සාමාජිකයකු සම්බන්ධයෙන් වූ විට හමුදා සාමාජිකයාගේ දෙමාපියන්

3.1 ඉහත 2 "අ" හි සඳහන් පරිදි හමුදා සාමාජිකයා මියගිය අවස්ථාවකදී එම මියයාම හමුදා සාමාජිකයා ත්‍රස්ත ක්‍රියාව නිසා ආබාධිතවීමේ ප්‍රතිඵලයක් බවට එම අයගේ රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර කළ වෛද්‍ය මණ්ඩලය විසින් කරනු ලබන වෛද්‍ය නිර්දේශය හා පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මගින් තහවුරුවීම හා එකී තහවුරුව මත පදනම්ව මෙම සහන හිමිගැන්වීම සඳහා අදාළ හමුදාධිපති විසින් පෞද්ගලික නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

3.2 ඉහත 2 "ආ" හි සඳහන් පරිදි හමුදා සාමාජිකයා සියදිවි නසා ගත් අවස්ථාවක දී එම සියදිවි නසා ගැනීම, පැවති ආබාධිත තත්ත්වය හේතුවෙන් ඇති වූ මානසික ව්‍යාකූලතාවයක් නිසාවූ සියදිවි නසා ගැනීමක් බව පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව මගින් තහවුරුවීම හා එකී තහවුරුව මත පදනම්ව මෙම සහන හිමිගැන්වීම සඳහා අදාළ හමුදාධිපති විසින් පෞද්ගලික නිර්දේශ ඉදිරිපත් කළ යුතුය.

3.3 සුදුසුකම් ලබන ඒ ඒ පුද්ගලයා වෙත සහන හිමිගැන්වීම සඳහා වන ඉල්ලීම් පහත සඳහන් තහවුරු කිරීමේ ලේඛන ද සහිතව මෙම අමාත්‍යාංශයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කළ යුතුය.

i. ආබාධිත හමුදා සාමාජිකයා වෙත වෛද්‍ය හේතුන් මත විශ්‍රාම ගැන්වීමට හා වයස අවුරුදු 55 දක්වා වැටුප් හා දීමනා ගෙවීමට මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබාදුන් ලිපියේ පිටපත

ii. හමුදා සාමාජිකයාගේ මරණ සහතිකය

iii. ඉහත 3.1 හා 3.2 ඡේදයන්හි කරුණු සනාථ කෙරෙන පශ්චාත් මරණ පරීක්ෂණ වාර්තාව සහ අනෙකුත් ලේඛන

iv. මියගිය හමුදා සාමාජිකයා සහ සහන සඳහා හිමිකම් ලබන ඉල්ලුම්කරු අතර, සම්බන්ධතාවය තහවුරු කිරීම සඳහා අදාළ වන ලේඛන

v. හමුදා සාමාජිකයාගේ වැන්දඹුව වෙත වැටුප් හා දීමනා ගෙවීම සඳහා වන ඉල්ලීමක දී වැන්දඹුව නිත්‍යානුකූලව හෝ චාරිත්‍රානුකූලව හෝ වාසය හා සංවාසය මගින් නැවත විවාහයකට එළඹී නොමැති බවට ග්‍රාම නිලධාරී විසින් නිර්දේශකර ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය

vi. හමුදා සාමාජිකයාගේ දරුවකු වෙත වැටුප් හා දීමනා ගෙවීම සඳහා වන ඉල්ලීමක දී එම දරුවා අවිවාහක, රැකියා විරහිත, යහපත් කල්ක්‍රියාවෙන් යුතුව නීතිගරුක පුරවැසියකු ලෙස සමාජයේ

ජීවත්වන්නේ ද යන්න ග්‍රාම නිලධාරී විසින් නිර්දේශකර ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කරන ලද ලිපිය

3.4 මෙම ප්‍රතිලාභය සඳහා හිමිකම ලැබෙනුයේ අමාත්‍ය මණ්ඩලය විසින් මෙම දීමනාව අනුමත කරන ලද 2021.04.27 දින සිට වන අතර, එදින සිට හිඟ දීමනා ගණනය කර ගෙවීමට කටයුතු කළ යුතුය.

3.5 මෙම දීමනා හිමිගත්වන මියගිය සාමාජිකයින්ගේ කලත්‍රයන් නිත්‍යානුකූලව, චාරිත්‍රානුකූලව හෝ වාසය හා සංවාසය මඟින් නැවත විවාහයක එළඹී නැති බව, දරුවන් වයස අවුරුදු 26 ඉක්මවා නොමැති බව, රැකියා විරහිත බව, අධ්‍යාපනය ලබන බව, යහපත් කල් ක්‍රියාවෙන් ජීවත්වන බව සහ දීමනා හිමිගත්වා ඇති සියළුම සාමාජිකයින් ජීවත්ව සිටින බව තහවුරු කිරීම සම්බන්ධ වාර්තාවක් වාර්ෂිකව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙතින් අදාළ හමුදාවේ හමුදාධිපති විසින් ලබාගත යුතුය.

පී.බී.එස්.සී. නෝනිස්
අතිරේක ලේකම් (ආරක්ෂක)
ලේකම් වෙනුවට